# ඉසුරු ගෙනෙන ඉඟුරු

- වගා කිරීම
- වගා නඩත්තුව
- අස්වනු සැකසීම

- වගාවට පෙර ගල් වැටි, කාණු හා ජීවී වැටි යන පාංශු හා ජල සංරක්ෂණ උපක්‍රම යොදා ඔබේ ඉඩම සංවර්ධනය කරන්න.
- වැඩි ආදායමක් සඳහා යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත් යොදා පරිසර හිතකාමීව වගාව මනාව නඩත්තු කරන්න.

## GINGER

*Zingiber officinale Roscoe*



### වැඩි විස්තර දැනගන්න විමසන්න

**අපනයන කෘෂිකර්ම ව්‍යාප්ති නිළධාරී**
සෑම බදාදා දිනකම ප්‍රදේශයේ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී

**සහකාර අධ්‍යක්ෂ**
අපනයන කෘෂිකර්ම දිස්ත්‍රික් කාර්යාල වල දී

**අපනයන කෘෂිකර්ම මාධ්‍ය හා සන්නිවේදන අංශය**
පේරාදෙණිය. දුරකතන අංක 0812-388651


dea.information2017@gmail.com

www.exagri.info

**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, පේරාදෙණිය. දුරකතන 081-2388651



සැකසුම : මාධ්‍ය හා සන්නිවේදන අංශය

## හැඳින්වීම

මහෞෂධ ලෙස හැඳින්වෙන ඉඟුරු ශාකයේ නිජබිම ඉන්දියාවයි. ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටමේ සිට මීටර 2,000 ක් දක්වා ප්‍රදේශවල ඉඟුරු සාර්ථකව වගා කළ හැකිය. සාමාන්‍යයෙන් තෙත් කලාපයේ ගෙවතු ආශ්‍රිතවත්, පොල් වගාවල අතුරු බෝග ලෙසත් මහා පරිමානයෙන් ඉඟුරු වගා කෙරේ. ඊට අමතරව ජල සම්පාදනය යටතේ වියළි කලාපයේ ද සාර්ථකව වගා කළ හැකිය. දේශයේ වාර්ෂික ඉඟුරු නිෂ්පාදනය මෙ.ටො.15,000 ක් පමන වේ. මේ සඳහා වගා අක්කර 7,000ක් පමණ දායක වේ. දේශීය ඉඟුරු ප්‍රභේද සඳහා වෙළෙඳපොළ ඉල්ලුම වැඩිය.

## ශ්‍රී ලංකාවේ ඉඟුරු වගාකරන ප්‍රධාන ප්‍රදේශ

මහනුවර, කෑගල්ල, නුවරඑළිය, ගම්පහ, කොළඹ, කළුතර, ගාල්ල, මාතර, රත්නපුර, කුරුණෑගල, බදුල්ල, මොණරාගල, පොළොන්නරුව හා අනුරාධපුරය

## ඉඟුරු ප්‍රභේද

දේශීය ඉඟුරු, රැන්ගුන්, චීන, කැලිකට් හා කොචින්

## ඉඟුරු වගාව සඳහා සුදුසු දේශගුණික අවශ්‍යතා

වාර්ෂික වර්ෂාපතනය - මි.මී. 2,500 (වසර පුරාම පැතිරුණු)
උච්චත්වය - මුහුදු මට්ටමේ සිට මීටර් 2,000 ක් දක්වා
උෂ්ණත්වය - සෙ.ග්‍රේඩ් 18 - 35 $^{0}$C

## ඉඟුරු බීජ අල අවශ්‍යතාවය

අක්. 01 කට ඉඟුරු බීජ අල කිලෝ 600 ක් පමණ අවශ්‍ය වේ.

## වගා ආරම්භය

තෙත් කලාපය - මාර්තු හා අප්‍රේල් (යල කන්නය)
වියලි කලාපය - සැප්තැම්බර් හා ඔක්තෝබර් (මහ කන්නය)

## බිම් සැකසීම


අඩි 01 ක් ගැඹුරට සී සා පස් කැට පොඩිකර පිලිස්සු දහයියා අඟුරු (කුල්තාන්) සහ කාබනික පොහොර එකතු කරන්න. පාත්තියට දින 05 ක් පමණ සූර්යාලෝකය ලබා දී පස ජීවාණුහරණය කළ යුතුය.

## පාත්ති සැකසීම

**පාත්ති ක්‍රමය**

මීටර් 01 ක් පළල මීටර් 3 ක් දිග පාත්ති.

මෙම පාත්තිය වටේම සෙන්ටිමීටර 30 ක් පළල හා ගැඹුර කාණුවකින් යොදන්න.




**වැටි ක්‍රමය**




**කඳු කාණු ක්‍රමය**

පාදයෙන් සෙ.මී. 60 ක් පළල පස් කඳු මේ සඳහා යොදාගනී.




ඉඟුරු අල වැටියේ සෙ.මී. 30 ක පරතරයකින් සිටුවා ගත යුතුය.

## බීජ ඉඟුරු අල සිටුවන පරතරය

පැල අතර පරතරය - සෙ.මී. 25 ක් (අඟල් 10)
පේළි අතර පරතරය - සෙ.මී. 25 ක් (අඟල් 10)
ලෙස සිටුවා ගත යුතුය.

සිටුවීමට පෙර බීජ ඉඟුරු අල කැප්ටාන් වැනි දිලීර නාශකයක මිනිත්තු 5-10 ක් පමණ ගිල්වා ප්‍රතිකාර කරගත යුතුය.

## ඉඟුරු සිටුවීම

ග්‍රෑම් 35-40 ක් අතර වූ ඉඟුරු කැබැල්ලක් එක් ස්ථානයක සිටුවිය යුතු වේ. අඟල් 01 ක පස් තට්ටුවකින් බීජ අල වසා ඒ මතට වසුන් යොදන්න. වසුන් සඳහා දහයියා, පිදුරු හෝ පොල් අතු භාවිතා කළ හැක.

## වගා නඩත්තු කටයුතු

- මාස 03 කට වරක් කාබනික පොහොර එකතු කරන්න.
- පොහොර පේළි අතර විසුරුවා හැර පසට කලවම් කරන්න.
- දහයියා වසුන දිරා යන විට නැවතත් යොදන්න.
- පඳුර මුලට පස් එකතු කරන්න. (වගා කාලය තුළ 5-6 වතාවක්)
- සෙවන ඉවත් කරන්න.

## පොහොර යෙදීම (හෙක්ටයාරයකට)

| | මතුපිට පොහොර | දින 45කට පසු | දින 90 කට පසු |
|---|---|---|---|
| කාබනික පොහොර | මෙ.ටො. 20 | - | - |
| යූරියා | - | කි.ග්‍රෑ. 82 | කි.ග්‍රෑ. 82 |
| ට්‍රිපල් සුපර් පොස්පේට් | කි.ග්‍රෑ. 100 | - | - |
| මියුරේට් ඔෆ් පොටෑස් | - | කි.ග්‍රෑ. 42 | කි.ග්‍රෑ. 42 |

## අස්වනු නෙලීම

අස්වනු නෙලීම ඉඟුරු අල භාවිතා වන අවසන් නිෂ්පාදනය මත තීරණය වේ. ඒ අනුව මාස 8-9 කින් අස්වනු නෙළාගත හැකිය.

ඉඟුරු ගස් පරිනත වන විට ක්‍රමයෙන් ගස් වියළී යයි. ඒ අස්වනු නෙලීමට වඩාත් සුදුසු කාලයයි. ඉඟුරු අල ගැලවීම පිනිස මුල්ලුවක් භාවිතා කිරීමෙන් අලයට හානි සිදු නොවේ.

සාමාන්‍ය අස්වනු නෙළන කාලය - දෙසැම්බර් - ජනවාරි වේ.

ඊළඟ කන්නයට සිටුවීම සඳහා බීජ අල හොඳින් වාතාශ්‍රය ඇති ස්ථානයක ගබඩා කර තැබිය යුතුය.

අස්වැන්න වගා කරන වර්ග අනුව වෙනස් වේ. හෙක්. 1 කින් චීන ඉඟුරු මෙ.ටොන් 20ක් පමණ ද දේශීය ඉඟුරු මෙ.ටො. 10 ක් පමණ ද ලබාගත හැකිය. චීන ඉඟුරු වල ගුණාත්මකභාවය දේශීය ප්‍රභේද වලට වඩා අඩුය.

## රෝග හා පළිබෝධ පාලනය

1. ඉඟුරු කඳ පනුවාගේ හානිය 2. අල කුණු වීමේ බැක්ටීරියා රෝගය
3. අල කුණුවීමේ දිලීර රෝගය 4. නෙමටෝඩා හානිය
(නිර්දේශිත පාලන ක්‍රම අනුගමනය කරන්න.)

## ඉඟුරු කඳක පණුවාගේ හානිය

- බෝග වගාවේ මුල් අවස්ථාවල දී වගාව නිරීක්ෂණය කර හානිවී ඇති කඳන් කපා පුලුස්සා දැමීමෙන් පාලනය කළ හැක.
- බෝග මාරුව අනුගමනය කර රෝග පැතිරීම පාලනය කළ හැක.

## ප්‍රධාන නිෂ්පාදන

| | |
|---|---|
| අමු ඉඟුරු | ලුණු මිශ්‍ර ඉඟුරු පෙති |
| විරංජනය කළ ඉඟුරු | ඉඟුරු ඔලියොරෙසීන |
| වියළි ඉඟුරු කුඩු | ඉඟුරු තෙල් |
| වියළි ඉඟුරු පෙති | ඉඟුරු ප්‍රිසර්ව් |
| ඉඟුරු බීම | ඉඟුරු අච්චාරු |
| සීනි මිශ්‍ර ඉඟුරු පෙති | ඉඟුරු රසැති ටොෆි |

## ඉඟුරු කල් තබාගැනීමේ ක්‍රම

අමු ඉඟුරු කපා වියළා ගැනීම, හුණු ජල ප්‍රතිකාර කර වියළා ගැනීම.

## ඉඟුරුවල ප්‍රයෝජන

ව්‍යාංජන රසකාරක, බේකරි නිෂ්පාදන හා බීම නිෂ්පාදන වල රසකාරක ලෙස ප්‍රධාන වශයෙන් යොදාගනී. මීට අමතරව ඖෂධ හා සුවඳ විලවුන් ලෙසද ඉඟුරු භාවිත වේ.

## විශේෂ උපදෙස්

- ඒ ඒ ප්‍රදේශ සඳහා අවශ්‍ය බීජ ඉඟුරු අල අදාළ ප්‍රදේශවලින්ම සපයා ගැනීමට කටයුතු කරන්න.
- සෑමවිටම නිරෝගී වගාවකින් බීජ අල සපයා ගන්න.
- බීජ ඉඟුරු අල දහයියා හෝ වැලි මත ලිහිල්ව අසුරා පිදුරු වලින් වැසීමෙන් කල්තබා ගත හැකිය.
- වසුන් යෙදීම හා වල් මර්ධනය ඉතා වැදගත්.
- ඉඟුරු පෙති කැපීමේ යන්ත්‍ර හා විවිධ වියළුම් යන්ත්‍ර වෙළෙඳපොලෙන් මිල දී ගත හැකිය.
- ඉඟුරු ඉතා කුඩා ඉඩකඩක් අවශ්‍ය සුළු ආයෝජනයකින් හා මාස 09ක් වැනි කෙටි කාලයකින් ආදායම් ලැබිය හැකි බෝගයකි.

*අවු කොටු පිරි රටක් - අනාගත සරු හෙටක් සඳහා අපනයන කෘෂි බෝග වවමු.*